**(හැඳින්වීම)**

සාමාන්‍ය සමයේ 34 වෙනි ඉරුදින වන අද ක්‍රිස්තු රාජ මංගලෝත්සව දිනය යි.

සකල මිනිස් වර්ගයාට විමුක්තිය අත්කර දුන් ක්‍රිස්තුස් වහන්සේ මුළු විශ්වයේ ම රජාණන් වශයෙන් පිළිගෙන ඔවුන් වහන්සේට විශේෂාකාරයෙන් අපගේ ප්‍රශංසාව හා නමස්කාරය පුද කිරීම අද දින දී සිදු කරනු ලබයි.

ක්‍රිස්තුන් වහන්සේගේ පාලනය සහ රාජ්‍යය සදාකාලික බවත්, උන්වහන්සේ සිය යාගික රුධිරය මගින් අප රාජකීය පූජක වංශයක් කළ බවත් අද දේව වචනය තුළින් ප්‍රකාශ කරයි. ක්‍රිස්තුන් වහන්සේගේ රාජ්‍යය මොලොවින් වූවක් නොවන බවත්, සත්‍යයට සාක්ෂි දරන පිණිස එතුමාණෝ මෙලොවට වැඩම කළ බවත් සුපුවතින් පහදා දෙයි.

අප ජීවිතවල ද රජාණන් ක්‍රිස්තුන් වහන්සේ බව පිළිගනිමින්, ස්වර්ගීය වැසියන් ලෙස දිවි ගෙවන්නට අවැසි ශුද්ධාත්ම ආලෝකය පතා, අපි මෙම උතුම් වූ යාගයට භක්තියෙන් සහභාගී වෙමු. තවද අදින් අවසන් වන ජන වන්දනා වසර තුළ අප මීසම් සංඝයට දානය කළා වූ සියලු වරප්‍රසාදයන් උදෙසා මුළු හදින් සමිඳාණන් වහන්සේට තුති ප්‍රශංසා කරමු.

**(විශ්වාසිකයන්ගේ යැදුම්)**

පිළිතුර - ස්වාමිනී, අප කරන යාච්ඤා අසා වදාළ මැනව.

1. ආදර දෙවි පියාණනි, මෙම ජන වන්දනා වර්ෂය තුළ ඔබවහන්සේගේ දරුවන් ආධ්‍යාත්මිකව පෝෂණය කරමින්, දේව රාජ්‍යයේ වටිනාකම් රෝපණය කළා වූ සුදතුම් පියතුමන් ඇතුළු පූජක හා පැවිදි සැම ආසිරි ගන්වා, වඩ වඩාත් සිය කැදවීම උදෙසා සාක්ෂි දරන්නට අවැසි ශුද්ධාත්ම බලයෙන් ඔවුන් පුරවාලන පිණිස,

2. ආදර දෙවි පියාණනී, ක්‍රිස්තුන් වහන්සේගේ රාජකීයත්වය පිළිගනිමින් සියලු ආකාර අභියෝග හා පීඩා හමුවේ ක්‍රිස්තුන් වහන්සේ උදෙසා සාක්ෂි දරන්නට අවැසි දිරියද, සැබෑ කිතුණු ගුණ දම් මගින් ලෝකය සුන්දර කරන්නට අවැසි නිසි මග පෙන්වීම ද අප මීසම් සංඝයේ සැමට නිබඳව ලබා දෙන පිණිස,

3. ආදර දෙවි පියාණනී, ක්‍රිස්තු රජාණන්ගේ නායකත්වයේ ආදර්ශය ලෙස ම සැබෑ මානව හිතවාදී , යහපත් ජන නායකයන් වන්නට අප දේශයේ සියලු ක්ෂේත්‍රවල කටයුතු කරන ජන නායකයන්ට අවශ්‍ය ප්‍රඥාව සහ නිසි මග පෙන්වීම දානය කරන පිණිස,

4. ආදර දෙවි පියාණනී, නොසැලෙන ඇදහිල්ලේ දිවියකට ඇතුළු වෙමින් ජ්වලිත ආධ්‍යාත්මයක් සහ ගැඹුරු යාච්ඤාවේ දිවියක් තුළ උද්යෝගීමත් කිතුණුවන් ලෙස ක්‍රිස්තු රජාණන්ගේ මහිමය ලොව පතල කරන්නට අප සැම නිරන්තරයෙන් බලගන්වන පිණිස,

5. ආදර දෙවි පියාණනී, මෙවර අ. පො. ස. උසස් පෙළ විභාගයට මුහුණ දෙන සියලු දූ පුතුන් වෙත ශුද්ධාත්ම වරම් නොමදව දානය කර, සාර්ථක ලෙස එම අභියෝගය ජය ගන්නට අවශ්‍ය මග පෙන්වීම ද, එම කාල සීමාව පුරාවට අවශ්‍ය ශාරීරික සහ මානසික සුවය ද නිරන්තරයෙන් දානය කර ඔවුන් සැම බලගන්වන පිණිස,